**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 වියාවනය කළ මතය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

### 1.2 වියාවනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වියාවනය කළ මතයක් පළකරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය යෝජනා ක්‍රමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා යෝජනා ක්‍රමය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
යෝජනා ක්‍රමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, යෝජනා ක්‍රමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය

හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල යෝජනා ක්‍රමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ යෝජනා ක්‍රමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, යෝජනා ක්‍රමය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 88 ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දී ගොවීන්ගෙන් ලැබුණු වාරික ආදායම හා ආයෝජන පොලිය ඇතුළුව ලැබුණු රු.133,810,611 ක මුදල කාලපරිච්ඡේදයේ ආදායමක් ලෙස ගිණුම්ගත නොකර සමුච්චිත අරමුදලට ගලපා තිබුණු බැවින් එම ප්‍රමාණයෙන් ලාභය අඩු වී තිබුණි. | මණ්ඩලය දායකයින්ගෙන් අය කරගන්නා වාර මුදල් වයස අවුරුදු 60 සම්පූර්ණ විමේදි ප්‍රතිලාභ ලෙස ගෙවිය යුතු බැවින්, අය කරන ලද වාර මුදල් සහ ඊට අදාළ පොලි මුදලේ එකතුව අරමුදල් ගිණුමට ගැලපීම තුළින් අනාගතයේදී ගෙවිය යුතු වගකීම් සඳහා අරමුදල ශක්තිමත් කිරිම අපේක්ෂා කෙරේ. | වාරික ආදායම හා ආයෝජන පොලිය කාලපරිච්ඡේදයේ ආදායමක් ලෙස හඳුනාගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 59 වන ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට රු.86,898,445,376 ක විශ්‍රාම වැටුප් වගකීම සඳහා වූ ආයු ගණක තක්සේරුව කර නොතිබූ බැවින් නිවැරදිභාවය තහවුරු නොවීය. | 2024 අයවැය අනුව ජීව ගණක තක්සේරු ලබා ගැනිම සඳහා මෙම වසරේදි කටයුතු ආරම්භ කර ඇත . | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ආයු ගණක තක්සේරුව සිදු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් යෝජනාක්‍රමයට අදාළව ගෙවූ රු10,585,145 ක මුදල, මුදල් ගලායාමක් ලෙසද රු.3,046,341,760 ක් වූ පෙර වර්ෂ ගැලපීම් කාරක ප්‍රාග්ධනයේ මුදල් ගලා ඒමක් ලෙස ද මණ්ඩලය වෙනුවෙන් පවත්වා ගෙන තිබූ ජංගම ගිණුමේ රු.470,320 ක වෙනස දෙවරක් ද වශයෙන් මුදල් ප්‍රවාහයට වැරදි සහගත ලෙස ගළපා තිබුණි. තව ද අළුතින් අරමුදල සඳහා දායක වූ ගොවීන්ගෙන් ලද මුදල රු.20,730,787 ක්, මුදල් ගලා ඒමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගළපා නොතිබුණ අතර මුදලින් පියවන ලද රු.20,000,000 ක ණය වාරිකය මුදල් ප්රවාහය තුළ මුදල් ගලා යාමක් ලෙස සටහන් කර ද නොතිබුණි. | ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට අදාළව ගෙවනු ලබන රු.10,585,145 ක පාරිතෝශික මුදල වේ. කාරක ප්‍රාග්ධනය වෙනස්කම් වලින් ගැලපීම් සිදුවන නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයට මේ වන විටත් ගැලපීම් සිදු වී ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලාඒම් සහ ගලායාම් නිවැරදිව ගැලපීම් කළ යුතුය. |

### 1.5.3 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.2,202,748,150 ක් සහ මුළු වගකීම් රු.89,457,327,488 ක් වූයෙන් වත්කම් ඉක්මවූ වගකීම් රු.87,254,579,339 ක් ද, මුළු ජංගම වත්කම් රු.1,092,503,529 ක් සහ මුළු ජංගම වගකීම් රු.2,527,354,554 ක් වූයෙන් ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම් රු.1,434,851,025 ක් ද වන අතර භාණ්ඩාගාරයේ දායකත්වයක් නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතින නිසා යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම ගැටළු සහගතවේ. | ගොවි විශ්‍රාම වැටුප් වගකීම වාර්ෂිකව වැඩිවන අතර, යෝජනා ක්‍රමය තුළ ආයෝජන නොමැතිකමත් මෙම යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ වාරික මුදල් වැඩිකිරීමකින් තොරව අවස්ථා කිහිපයකදී රාජ්‍ය ප්‍රතිපත්ති නිසා වැඩිකිරීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇති අතර, සෑම වර්ෂයකදීම රජයේ අයවැය මගින් මුදල් වෙන්කර ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකරගෙන යනු ලබයි. | යෝජනා ක්‍රමය සක්‍රිය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවීන්ගේ නිවැරදි ජීව දත්ත තොරතුරු යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් නොමැති වීම හේතුවෙන් මියගිය සහ වෙනත් හේතූන්මත හිමිකම් නොපාන ගොවීන්ගේ විශ්‍රාම වැටුප දිගින් දිගටම තැපැල් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. මේ හේතුවෙන් 2023 වර්ෂයේ දී ගොවීන් විසින් භාර නොගැනීම නිසා තැපැල් දෙපාර්තමේන්තුව විසින් ආපසු එවූ විශ්‍රාම වැටුප රු.259,373,191 ක් වූ අතර සමාලෝචිත වසර අවසානයට එම දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ශේෂය රු.81,000,602 ක් විය. විශ්‍රාම වැටුප් ලබා නොගත් ගොවීන් පිළිබඳ විස්තර නඩත්තු කර නොතිබීම නිසා වර්ෂ අවසාන ශේෂයෙහි සහ ලද මුදලෙහි නිරවද්‍යතාව තහවුරු නොවීය. | ප්‍රධාන කාර්යාලය වෙත ලැබෙන සියලු ලේඛන පරික්ෂා කර බලා නිසි පරිදි ප්‍රධාන කාර්යාලයේ යම් ස්ථානයක හෝ ලේඛනාගාරයේ ගබඩා කිරීමටත් එම ලේඛනවල තොරතුරු සහිත පරිසනක දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සිදු කෙරෙමින් පවතින බවද වැඩිදුරටත් දන්වා සිටිමි.දිසා ගණකාධිවරුන් විසින් නොගෙවූ විශ්‍රාම වැටුප් ලේඛන අන්තර්ජාලය ඔස්සේ අපවෙත ලබා දෙනු ලබන අතර එය විධිමත්ව පවත්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. | හිමිකම් නොපෑ මුදල් පිළිබඳ තොරතුරු යාවත්කාලීනව පවත්වාගත යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත | | | |
| | (i) 6(1) වගන්තිය | අවුරුදු 60 සම්පූර්ණ වූ විට විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු වුවත් වයස සම්පූර්ණ කළ ගොවීන් හඳුනාගෙන විශ්‍රාම වැටුප ගෙවීම් කර නොතිබුණි | අවුරුදු 60 සම්පූර්ණ වූ සහ වයස සම්පූර්ණ වී මෙතෙක් ගොවි විශ්‍රාම වැටුප් ලබා නොගත් විශ්‍රාම වැටුප් ලාභින්ගේ අයදුම්පත් හා අදාළ සියලු ලේඛන ප්‍රධාන කාර්යාලයට යොමු කරන මෙන් කාර්යාල දැනුවත් කර ඇත. | වයස සම්පූර්ණ කළ අයගේ විශ්‍රාම වැටුප් නොපමාව ගෙවීම් කළ යුතුය. |
| | (ii) 12(ඇ) වගන්තිය | යෝජනාක්‍රමය සම්බන්ධයෙන් ජීව දත්ත ඇතුළත් තොරතුරු පද්ධතියක් පවත්වා තිබුණද යාවත්කාලීනව දත්ත ඇතුළත් කර යාවත්කාලීන නොකිරීම නිසා අවශ්‍ය මූල්‍ය හා මෙහෙයුම් වාර්තා ලබා ගැනීමට නොහැකි විය. | E.R.P මෘදුකාංග පද්ධතිය බැංකු පද්ධතිය සමඟ සෘජු සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් දත්ත ඇතුළත් කර ගැනීමට හැකියාව උදාවනු ඇත. පැවති සේවක හිඟය මත පසු වාරික පරිගණකගත කිරීම සිදු කිරීමට නොහැකි වූ අතර 2022 වර්ෂයේ සිට නැවතත් පසු වාරික පරිගණකගත කිරීම ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | යෝජනා ක්‍රමයේ ජීව දත්ත තොරතුරු පද්ධතිය යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) 12(ඇ) වගන්තිය | යෝජනා ක්‍රමය පිළිබඳව සමීක්ෂණ අගැයුම් හා සමාලෝචනය කර මෙහෙයුම් රීතිවල වෙනස්කම් ඇති කිරීම සිදු කළ යුතු වුවත්, ගොඩනගාගන්නා ලද නීතියක් රීතියක් හෝ රෙගුලාසියක් නොමැතිව හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප ආපසු ගෙවීමේ දී අර්ධ වර්ෂයකට සියයට 3.32 ක පොලී ප්‍රතිශතයක් ශුද්ධ වාරික මුදලට අමතරව ගණනය කර තිබුණි. | නිසි පරිදි දායක මුදල් ගෙවීම් නොකර දායකයන් හට ශුද්ධ වාර මුදල් හා පොලිය ගෙවීම් සිදු කරන බව 1987 අංක 452/12 දරන ගැසට් පත්‍රයේ 13 වන නියෝග මඟින් දක්වා ඇත. එම ගණනය කිරීම් ජීවගණිතඥයෙකු විසින් සිදු කර ඇත. | ශුද්ධ වාරික මුදල මත පොලිය ගණනය කිරීමට රීතියක් ගොඩනගාගත යුතුය. |
| (iv)15(1) වගන්තිය | පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හැර ඇති දායකයෙකුට සහතිකය යටතේ වූ ප්‍රතිලාභ අහිමි කිරීම දායකයා වෙත දැන්වීමට මණ්ඩලයට බලය ඇතත් ප්‍රතිලාභි පාර්ශවය විසින් පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හරිනු නොලබන නමුත් කඩින් කඩ හෝ වාරික 5 ක් නොගෙවූ ප්‍රතිලාභීන් ද ඔප්පුව කඩකළා සේ සලකා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමි කර තිබුණි. | 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම පනතේ 15(1) වගන්තිය ප්‍රකාරව වාරික 5 ක් ගෙවීම පැහැර හැර ඇති ගොවි මහතුන්ගේ ප්‍රතිලාභයන් අහිමි වනු ඇත. වාරික ගෙවීමේදී සලකා බලනු ලබන්නේ ඔහු ගෙවනු ලබන වාරිකය කවදා ගෙවිය යුතු වාරිකයක්ද යන්නයි. ඒ අනුව කිසියම් වාරිකයක් කන්න 5 ට වඩා එනම් වසර 2 ½ කට වඩා ප්‍රමාද වුවහොත් ඔහුගේ සහතික ඔප්පුවේ සඳහන් ප්‍රතිලාභ අහිමි වනු ඇත. | වාරික මුදල් නිසිපරිදි නොගෙවීම මත ප්‍රතිලාභ අහිමි වීම දායකයා දැනුවත් කළ යුතුය. |
| (v)27(1) වගන්තිය | විෂයභාර අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයභාර අමාත්‍යාවරයාගේ එකඟතාවය මත, යෝජනාක්‍රමය විසින් ලබා ගන්නා ණය ප්‍රමාණය තීරණය විය යුතු වුවත් එවැනි එකඟතාවයක් ලබානොගෙන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් මෙම යෝජනාක්‍රමයට රු.290,800,755 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පොලියද ඇතුළත් මුළු ණය ශේෂය රු.518,782,124 ක් විය. | 2010 හා 2011 වර්ෂවලදී ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා යෝජනා ක්‍රමයේ මුදල් නොමැති වීම නිසා මුදල් අමාත්‍යාංශය විසින් ලබාදී ඇති නිර්දේශ අනුව කෘෂි රක්ෂණ හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම තුළින් මුදල් ලබාගෙන ගෙවීම් සිදුකර ඇත. මෙම ණය මුදල් ක්‍රමිකව ප්‍රතිපූරණය කරනු ලැබේ. | විෂයභාර සහ මුදල් අමාත්‍යාවරයාගේ එකඟතාවය මත, යෝජනා ක්‍රමයට ණය ලබාගත යුතුය. |
| (ආ) සහතික ඔප්පුවේ 6 වගන්තිය | ගෙවා ඇති අර්ධ වාර්ෂික දායක මුදල් ප්‍රමාණයෙන් සියයට 75 ක් ලැබී තිබේ නම් මණ්ඩලය විසින් තීරණය කරන පරිදි | අඩුකළ විශ්‍රාම වැටුප් සැකසීම සඳහා දායකත්වය අවලංගු නොවී දායකයෙකු ගෙවිය යුතු වාරික ප්‍රමාණයෙන් සියයට 75 වඩා ගෙවීම් කර ඇත්නම් ඔහුට අඩුකළ | අර්ධ වාර්ෂික දායක මුදල් ලැබීම් තොරතුරු නිසි පරිදි පැවැත්විය |

| | | | |
|---|---|---|---|
| | නියමිත විශ්‍රාම වැටුපට වඩා අඩු විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇතත් එම දායකයින් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමිකර තිබුණි. | විශ්‍රාම වැටුපක් සකසනු ලබයි. | යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.21,428,256 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.192,873,887 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.171,445,631 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ගොවීන්ගෙන් ලැබුණු වාරික ආදායම හා ආයෝජන පොලිය රු.133,810,611 ක මුදල කාලපරිච්ඡේදයේ ආදායමක් ලෙස ගිණුම්ගත නොකර සමුච්චිත අරමුදලට ගලපා තිබීම හා ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම් වැඩිවී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යෝජනා ක්‍රමයට අදාළව අනුමත කාර්ය මණ්ඩලයක් නොසිටින අතර මණ්ඩලයෙහි මුළු සේවක වැටුප් වියදමින් හා අනිකුත් පරිපාලන වියදම් වලින් ද සියයට 50 ක් බැගින් වූ ප්‍රතිශතයක් යෝජනා ක්‍රමයේ වියදම් ලෙස හරකර තිබුණි.හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප් ආපසු ගෙවීමේ දී ප්‍රතිලාභියාගෙන් ලැබෙන සෑම වාරිකයකින්ම රු.15 බැගින් පරිපාලන වියදම් වශයෙන් ද ගොවියා නිසි පරිදි ගෙවූ එක් වාරිකයකට රු.30 බැගින් රක්ෂණ ගාස්තුවක් ද ගොවියාට ආපසු ගෙවන මුදලින් රු.150 ක් යලි රක්ෂණ ගාස්තුවක් ලෙස ද අඩු කර ගොවියාට ආපසු ගෙවන මුදල තීරණය කර තිබුණ ද මේ සඳහා කිසිදු රීතියක් හෝ අනුමත කර ගෙන නොතිබුණි. | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වන ගොවි මහතුන් හට ගොවි විශ්‍රාම වැටුප් පනතේ 4 ආ, ඇ සහ ඈ වගන්ති අනුව විශ්‍රාම වැටුපට අමතරව මරණ පාරිතෝෂිතයක් හා පූර්ණ අර්ධ බෙලහීන දීමනාවක් ලබා දිය යුතුවේ. ලබා දෙනු ලබන එම රක්ෂණ ආවරණය වෙනුවෙන් කන්නයක් සඳහා රු.30 ක රක්ෂණ ගාස්තුවක් අය කරනු ලබයි. | අනුමත රීතියක් නොමැතිව වාරික මුදලින් වෙනත් අය කිරීම් නොකළ යුතුය. |
| (ආ) | තොරතුරු පද්ධතියක් සඳහා දත්ත රැස්කිරීමට 2017 වර්ෂයේදී රු.5,640,925 ක් වියදම් කර ඇතත් අපේක්ෂිත තොරතුරු රැස් නොකිරීම නිසා තොරතුරු පද්ධතිය ගොඩනගා නොතිබුණි. | 1987 වර්ෂයේදී ආරම්භ කළ යෝජනා ක්‍රමයේ වාරික අයවීම් ගොවියා වෙත ලබා දෙනු ලබන වාරික සටහන් පොත තුළ සටහන් කිරීම තුළින් හඳුනාගත හැකි අයුරින් සකසා ඇති මෙම වාරික සටහන් පොත්වල තොරතුරු සමීක්ෂණය මඟින් එක්කොට පිටපත් ලබා ගැනීම සඳහා කටයුතු සිදු කළද අදාළ සමීක්ෂණ කටයුතු මඟින් තොරතුරු ලබා ගැනීම ඉතා දුෂ්කර වීම නිසා අපේක්ෂිත ලෙස තොරතුරු ලබා ගැනීමට නොහැකි විය. | තොරතුරු රැස්කර අදාළ පද්ධතිය ගොඩනගා යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ 2007 දෙසැම්බර් 31 දිනට පැවති සමූහ ජීවිත රක්ෂණ අරමුදලේ සහ එයට අදාළ ආයෝජනය වූ රු.251,547,146 ක ශේෂය කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ගිණුමට මාරු කර තිබුණි.යෝජනාක්‍රමයේ මුදල් අවශ්‍යතාව සඳහා 2010, 2011 සහ 2012 වර්ෂවලදී සමූහ ජීවිත රක්ෂණ අරමුදලෙන් රු.295,230,442 ක ණය මුදලක් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා 2023 වර්ෂය දක්වා වූ සමුච්චිත පොලිය රු.422,547,571 ක් විය. සමාලෝචිත වර්ෂයේ යොජනා ක්‍රමයේ පරිපාලන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.206,225,000 ක මුදලින් රු.7,980,276 ක මුදලක් ද ගොවීන්ගෙන් ලද වාරික ආදායමින් රු. 20,000,000 ක් යොදාගෙන ණය මුදලින් කොටසක් වශයෙන් පියවා තිබුණි. මේ අනුව ජීවිත රක්ෂණ අරමුදලෙහි ආයෝජනය ණය මුදලක් බවට පත් වී තිබුණි. | රක්ෂණය, වාර මුදල් රුස් කිරිම, අරමුදල් ගොඩ නැගිම හා ගෙවීම් සිදු කිරිම කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය මගින් සිදු කරනු ලැබේ. මෙම යෝජනා ක්‍රමය ආරම්භයේදී මෙම ජිවිත රක්ෂණ ආවරණය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මඟින් ලබා ගත් අතර, එහිදී ගොවියෙකු සඳහා දායක මුදල රු.60 බැගින් එම ආයතනයට ගෙවන ලදී. 1994 වර්ෂයේදී එම ජිවිත රක්ෂණ අවධානම මණ්ඩලය විසින් දැරිමට භාර ගෙන එම අරමුදල මණ්ඩලය තුළ ගොඩ නගන ලදී. මෙහි උපරිම ආවරණය රු.50,000 බැවින් අනපේක්ෂිත තත්ත්වයක් ඇති වුවහොත් විශාල වන්දි මුදලක් නිදහස් කිරිමට සම්භාවිතාවයක් පවතී. ආයුගණක තක්සේරු වාර්තා ලබා ගැනිම සඳහා කටයුතු ආරම්භ කර ඇති අතර, එහිදී ලබා දෙනු ලබන වාර්තාවට අනුව කටයුතු කරනු ලැබේ. | යෝජනා ක්‍රමයට ආර්ථිකමය වාසි සැලසෙන පරිදි නිවැරදි තීරණ ගත යුතුය. |
| (ඇ) | මාවිල් ආරු සොරොව්ව වැසීම නිසා ගොවීන් වෙත වගා හානි වන්දි ගෙවීම සඳහා රුපියල් මිලියන 7 කට වැඩි මුදලක් පෙර වර්ෂයන්හිදී ගෙවීම් කර තිබුණු අතර මේ සම්බන්ධව ගොනු කරන ලද නඩුව නීතිපති උපදෙස් සඳහා 2007 නොවැම්බර් 30 දින යොමුකර ඇතත් මෙම වාර්තාවේ දින වන විටත් ඒ සම්බන්ධයෙන් කිසිදු පසුවිපරමක් සිදුකර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත | ගොනු කරන ලද නඩු සම්බන්ධයෙන් පසුවිපරම් කළ යුතුය. |
| (ඉ) | 2012 වර්ෂයේ සිට හිමිකම් නොපෑ ගෙවියයුතු රු.4,254,932,613 ශේෂයෙන් රු.3,033,329,200 ක මුදලක් අදාළ ගොවීන්ට ගෙවීමට කටයුතු නොකර විශ්‍රාම වැටුප් අරමුදලට මාරු කිරීම නිසා අරමුදලේ අවාසිදායක තත්ත්වය අඩුවී තිබුණි. | 2012 හා 2013 වර්ෂයන් සඳහා ගෙවිය යුතු විශ්‍රාම වැටුප වූ රු.3,033,329,200 ක වටිනාකම කපා හැරිම සඳහා අංක 535/04 දරන අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වී ඇත. | ගොවීන් හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප සොයා බලා ගෙවීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යෝජනා ක්‍රමය තුළ ලියාපදිංචි 871,425 ක්වූ ගොවීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අවුරුදු 61 සිට අවුරුදු 93 දක්වා වයස් ගතවූ ගොවීන් 474,803 ක් වුවත් ඉන් 264,227 දෙනෙකුට විශ්‍රාම වැටුප් ගෙවා නොතිබුණි. 2022 දී අවුරුදු 60 සම්පූර්ණ කළ විශ්‍රාම වැටුප හිමිවිය යුතු ඉල්ලුම්පත්‍ර එවා නොමැති, දායකයින් සොයා විශ්‍රාම වැටුප් ලබාදීමට අවශ්‍ය කටයුතු කරන ලෙස සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන් වෙත 2023 ජුනි 23 යොමු කරන ලද අංක 6/FPS/පා/2 දරන ලිපිය මගින් දැනුම් | වයස අවුරුදු 60 සම්පූර්ණ වී මෙතෙක් ගොවි විශ්‍රාම වැටුප් ලබා නොගත් ගොවීන් මේ වන විට දැනුවත් කර ඇති අතර, සියළුම දිස්ත්‍රික් කාර්යාල සහකාර අධ්‍යක්ෂවරුන් මෙම කටයුත්ත ප්‍රමුඛ කාර්යයක් සේ සලකා කටයුතු කර ඇත. | අවුරුදු 60 සම්පූර්ණ කළ විශ්‍රාම වැටුප ඉල්ලුම් නොකළ දායකයින් හඳුනාගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දී තිබුණද, දිස්ත්‍රික් කාර්යාල 12 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී ඉන් 6 ක් මේ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | අනුගාමී වාරික 5 ක් කඩ කර ඇති විට ඒ බව දැනුවත් කර ඔප්පුව සක්‍රිය කිරීම සඳහා අවශ්‍ය පහසුව සලසා නොමැති නිසා නියමිත වයස සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුප් සඳහා අයදුම් කළ දායකයින්ගෙන් 2021 වර්ෂයේදී දායකයින් 1127 දෙනෙකුටද 2022 වර්ෂයේදී දායකයින් 2226 දෙනෙකුටද සමාලෝචිත වර්ෂයේ දායකයින් 715 දෙනෙකුටද විශ්‍රාම වැටුප් නොගෙවා ශුද්ධ වාරික මුදල් ගෙවීම් කර තිබුණි. | නිසි පරිදි දායක මුදල් ගෙවීම් නොකළ දායකයන් හට ශුද්ධ වාර මුදල් හා පොලිය ගෙවීම් සිදු කරන බව 2014 අංක 452/12 දරන ගැසට් පත්‍රයේ 13 වන නියෝග මඟින් දක්වා ඇත. ඒ අනුව අදාළ ගොවීන් වෙත ශුද්ධ වාරික ගෙවීම සිදු කර ඇති බව පෙන්වා දෙමි. | අනුගාමී වාරික 5 ක් කඩ කර ඇති විට ඒ බව දැනුවත් කර ඔප්පුව සක්‍රිය කිරීම සඳහා අවශ්‍ය පහසුව සැලසිය යුතුය. |
| (ඇ) | 2021 වර්ෂයෙන් පසු බඳවාගැනීමේදි පහත දුර්වලතා නිරීක්ෂණය විය. | | |
| | (i) ගෙවීම් පැහැර හැර ඔප්පුව අක්‍රිය වී ඇති ගොවීන් හඳුනාගෙන ඔවුන්ගේ වාර මුදල් භාර නොගන්නා ලෙස එම ගිණුම අත්හිටුවීමට ක්‍රමවේද හඳුන්වා දී නොතිබීම. | දායකයන්ගේ පසු වාරික අයවීම් පරීක්ෂා කිරීම් සම්බන්ධයෙන් පහත ක්‍රියාකාරකම් සිදු කර ඇත.<br>• බැංකු ස්ථාවර නියෝග මඟින් ලැබීම් වාරික පිළිබඳ වාර්තා තබා ගැනීම කළ යුතුය.<br>• SMS මඟින් වාරික ගෙවන ලෙස දායකයන් දැනුවත් කිරීම සිදුකර ඇත. ඒ අනුව 2023 ඔක්තෝම්බර් පලමු කන්නයේදී ඔබගේ ගොවි විශ්‍රාම වැටුප් වාරික ස්ථාවර නියෝග මඟින් ගෙවීමේදී ඔප්පු අංකය මණ්ඩලය වෙත යොමු වන බවට බැංකුව මඟින් තහවුරු කරගන්නා ලෙස දායකයින් දැනුවත් කරන ලදී. මෙලෙස SMS පණිවිඩ මඟින් වාරික ගෙවීම් පැහැරහැරීම වලක්වා ගැනීම සඳහා දැනුවත් කිරීම් ආරම්භ කරන ලදී.<br>ඉදිරියේදී 1918 සේවාව මඟින් දායකයන්ට දුරකතනයෙන් දැනුවත් කිරීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සකස් කරමින් පවතී. | ඔප්පුව කඩ කිරීම හඳුනා ගැනීමට ක්‍රමවේද හඳුන්වා දිය යුතුය. |
| | (ii) 2023 ක්‍රියාකාරී සැලැස්මේ විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයේ ඵලදායීත්වය ඉහළ නැංවීම යන උපායමාර්ගය යටතේ සැලසුම් කළ ක්‍රියාකාරකම් 3ක් ප්‍රකාරව දායකයින් සක්‍රීයව පවත්වා ගැනීමට වැඩසටහන් හඳුන්වා නොදීම, කෙටි පණිවිඩ (SMS) මඟින් දැනුවත් කිරීම හා ගිණුමේ ශේෂය පරීක්ෂා කිරීම සඳහා වෙබ් යෙදවුම් හඳුන්වා දීම සිදු කර නොතිබීම. | SMS මඟින් වාරික ගෙවීම දැනුම් දීම සහ දායකයින් දැනුවත් කිරීම සඳහා සිදු කළයුතු තාක්ෂණික කටයුතු මේ වන විට අවසන් කර ඇත. එහිදී තාක්ෂණික කටයුතු අවසන් කිරීමෙන් පසු තොරතුරු තාක්ෂණ අංශය වෙත ලබා ගනු ලබන SMS පණිවිඩය දායකයන් වෙත යැවීමට කටයුතු කරනු ලැබේ. | දායකයින් සක්‍රීයව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | තරඟකාරී රක්ෂණ ආයතන විසින් වාරික ගෙවීම් සහ ප්‍රමාදවීම් පිළිබඳව දායකයින් දැනුවත් කිරීම් සිදු කර ඔවුන්ට මග පෙන්වීම ලබා දෙන නමුත් මණ්ඩලය විසින් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම. | නියෝජිත ජාලය මඟින් දායකයින් දැනුවත් කිරීම අමතර පිරිවැයක් දැරීමට සිදුවන බැවින් SMS පණිවුඩ ක්‍රමය යොදාගැනිමට මණ්ඩලය විසින් කටයුතු කර ඇත. | කර්මාන්තයේ පවතින ප්‍රවර්ධන තත්ත්වයන් අනුගමනය කළ යුතුය. |